තරුණී මාතා

එක වේලක්වත් මැල්ලුමක් හදුගන්න බැරි අම්මලාටයි

# ඇස රවටන පලාවලට රැවටෙන්න නම් එපා



## රටටම පලා බෙදන පලා ලිය ජානකී

**යට විහිදෙන පලා පාත්ති පොළෝ ගැබ මත අතුළ හරිත පළසක් මෙනි. මේ සාර අස්වැන්න ඊළඟ හිමිදිරියේදී ඉතා නැවුම් ලෙස වෙළෙඳපොළට එන්නට ත්‍රී ස්ටාර් ෆාම් වෙළෙඳ නාමයෙන් ඇසිරේ.**

මෙලෙස දිරියෙන් විරියෙන් සැබෑ කරගෙන ඇත්තේ ජානකී කත්‍රිආරච්චි පාලොස් වසකට පෙර දුටු සිහිනයයි. හිත ඇත්නම් ජීවිතය බොහෝදුර ඉසව්වකට රැගෙන යාහැකි බව අපේ අම්මාවරුන්ට ඇය පසක් කරලන්නේ මෙලෙසිනි.

"හරිත පරිසරයක උපදින්න අපි පින්කර තිබෙනවා.

ඒත් තුන්වේලෙන් එකකටවත් මැල්ලුමක් හදගන්න වාසනාවක් නැහැ." බබාලා තුන්දෙනා පුංචි කාලේ පවුලේ පෝෂණය ගැන මම මෙහෙම සන්තාප වුණා. ගෙදරම රැඳුණු මටත් පලා මැල්ලුම ප්‍රශ්නයක් නම් රැකියාවට යන මවුවරුන්ට මේ ප්‍රශ්නය මොනතරම් බරපතළ ඇතිද ?

මම දිගින් දිගටම හිතුවා. පලා ශුද්ධ කරන්න, සෝදන්න, ලියාගන්න අසීරු කාර්යබහුල කාන්තාවන්ට සේවයක් සලසන ව්‍යාපාරයක් ගැන අපූරු සිතිවිල්ලක් පහළ වුණේ මේ අතරේදීයි.

උසස් පෙළ ගණිත අංශයෙන් සමත්ව හිටියත් මම ඒ වනවිට දරු පවුල වෙනුවෙන්ම ඇප කැප වෙලයි හිටියේ.

ඒ නිසාම කාලයේ තාලයට පලා ව්‍යාපාරය සුළු පරිමාණයෙන් පටන් ගත්තා. දස වැනි දරුවන් තිදෙනා ඇස්මානයේම තබාගෙන කරන මේ ව්‍යාපාරය දරු තිදෙනා වෙනුවෙන් ත්‍රී ස්ටාර්ස් යැයි නම් කළා. අද පාරිභෝගික ප්‍රසාදය නොමඳව ලැබෙන ත්‍රී ස්ටාර්ස් ෆාම් ව්‍යාපාරය ආරම්භ වුණේ මැල්ලුම් කොළ පැකට් 5 කින්. නුගේගොඩ සුපිරි වෙළෙඳ සැලකට දමූ පැකට් 5 න් 3 ක්ම විකිණීම ලැබූ ලොකු ජයග්‍රහණයක් වුණා. මේ ඉල්ලුමෙන් සැහීමකට පත් වී මම ඊළඟ දවසේ මැල්ලුම් පැකට් 10 ක්ම වෙළෙඳපොළට දමන්න දිරිමත් වුණා. පිරිසුදු කමින් ඉහළ මගේ අලුත් නිෂ්පාදනයට ලැබුණු පාරිභෝගික ප්‍රතිචාර විශාලයි.

ඒ වන විට දිනෙන් දින සරු සාරවන ව්‍යාපාරය වෙනුවෙන් මට පලා වගාවක් තිබුණේ නැහැ. වෙනත් ගොවිපොළකින් මිල දී ගත් පලා මිටි ගෙනැවිත් ලියා අසුරා විකිණීමයි මෙහිදී මා අතින් සිදු වුණේ. මේ ගොවිපොළට පලා මිලදී ගන්නට ගිය විටෙක පලා පාත්තියකට රසායනික පළිබෝධනාශක ඉසිමින් සිටින අයුරු දුටුවා.

ඒත් නෙවැනි දවසේ එහි යන විට මේ පාත්තිය එහි තිබුණේ නැහැ. "ඒ පාත්ති තමයි ඊයේ උදේ දුන්නේ" මා කළ විමසුමකදී ඔවුන් පිළිතුරු දුන්නා. "මම "පාරිභෝගිකයන්ට කන්න දෙන්නේ වස විසද?" මගේ හිත මගෙන්ම ප්‍රශ්න කරන්න පටන් ගත්තා. ඉන්පසුවයි වසෙන් විසෙන් තොර මගේම කාබනික ගොවිපොළක් පටන් ගන්න හිතුවේ.

> **මේ ගමන පටන් ගත්තේ පැකට් පහකින්**

විදුහල්පතිවරයෙක් වූ මගේ තාත්තාට තිබුණේ ගොවිතැනටත් හුරුපුරුදු දැනක්. මගේ බාලවියේ මතකය පුරාම කුඹුරට, කොරටුවට යන තාත්තා පසුපස්සේ ගොස් ලැබූ අත්දැකීම් ඕනෑ තරම්.

මේ අත්දැකීම්වලින් තමයි කාබනික ගොවිපොළකට මම දිරිමත් වුණේ. අද වන විට ත්‍රී ස්ටාර්ස් ගොවිපොළට ඕගනික් සම්මතයට අනුව නෙදර්ලන්තයේ තත්ත්ව සහතිකයත් හිමියි. සැබැවින්ම 100% ක්ම වසෙන් විසෙන් තොරව ශ්‍රී ලංකාවේ පවත්නා එකම එක ගොවිපොළ ලෙස අපි නිහතමානී සතුටක් විඳිනවා.

පවුලේ සෞඛ්‍ය ගැන හිතන පාරිභෝගිකයන්ගෙන් ත්‍රී ස්ටාර්ස් ෆාම් නිෂ්පාදනවලට තිබෙන්නේ ඉහළ ඉල්ලුමක්. ඇත්තටම ආහාර වේලකින් පස්සේ අතුරුපසට බෙහෙත් අහුරක් බොන අවාසනාවන්ත තත්ත්වය පසු පස අපි කන බොන දේත් ප්‍රධාන හේතුවක්ව තිබෙනවා. ඒ නිසායි දැනුවත් ජනතාව කාබනික නිෂ්පාදන සඳහා විශේෂ අවධානයක් යොමු කරන්නේ.

රසායනික හා කෘමිනාශකවලින් පරිපූර්ණව වගා කරන එළවළු, පලා ප්‍රියංකර බවින් ඇස රවටනවා. මේවායේ අන්තර්ගත කෘමිනාශක හා රසායන පොහොරවල ඇති වස ජලයෙන් සේදූවත් උණුසුම්ව පිසුවත් ඉවත්වන්නේ නැහැ.

කාබනික ගොවිපොළක් පවත්වාගෙන යාම බොහොම සීරුවට කළ යුත්තක්.

එයට ගොම පොහොර සපයන ගවයාත් ආහාරයට ගත යුත්තේ කාබනික පරිසරයේම හැදුණු තණකොළයි. එමෙන්ම ජල පහසුකම් සපයාගත යුත්තේත් ගොවිපොළේම ස්වභාවික ජල ප්‍රභවයකින්. එවැනි ගොවිපොළක් හඳුනා ගැනීමට එහි සාර්ථක ලෙස පවත්නා මීමැසි පාලනය ඉවහල් වෙනවා. පලා කොළ, එළවළු මත පණුවන් ආහාරයට ගත් පලුදුවීම් තිබීම කාබනික නිෂ්පාදනයක් බවට සොබා දහමෙන්ම ලැබෙන සහතිකයක් වගේ.

අපට තිබෙන්නේ පෝෂණ ගුණයෙන් අනූන ආහාර ලබාදෙන රත්තරං පොළොවක්. හිතාමතාම මේ පොළොවට වස විස එක් කිරීම බරපතළ අපරාධයක් වනවා.

එපමණක් නොවෙයි පෝෂණ ගුණයෙන් ඉහළ අපේ පාරම්පරික එළවළු බොහෝමයක් අද බොහෝ දෙනකු හඳුනන්නේ නැහැ. නිරා ලීක්ස්, රතු නිවිති, රතු තම්පලා, සාරණ, කහ බතල වැනි දේ අපේ ගොවිපොළේ වගා වන්නේ පෝෂණ ගුණයත් සමඟ මේවා යළිත් අපේ ඇත්තන්ට හඳුන්වා දෙන්නටයි. සැබැවින්ම ඔබට වසෙන් විසෙන් තොර ආහාර සංස්කෘතියක් සමඟ නිරෝගිමත් ජීවිතයක සුවය උදකරලීමේ සතුට මගේ ලොකුම ඉතිරියයි. ත්‍රී ස්ටාර්ස් ෆාම් තුළින් මම සාර්ථක ව්‍යාපාරික කාන්තාවක් වූයේ ඒ ආශීර්වාදයෙන් යැයි හැඟෙනවා.

ඇගේ ලිපිනය -
**ත්‍රී ස්ටාර්ස් ඕගනික් ෆාම් පෞද්ගලික සමාගම**
**නො. 10 කේම්බ්‍රිජ් කෝට්**
**ගංගාරාම පාර,**
**කළුබෝවිල, පිළියන්දල.**

**ප්‍රසන්නී ගී තරංගමා**







ජායාරූප - **නිරෝෂ් ප්‍රියංක**

### පලා වවමු - තෑගි දිනමු ලබන සතියේ තරුණී බලන්න

පලා වගාව පිළිබඳ සුවිශේෂ ලිපි පෙළක් ලබන සතියේ සිට තරුණී පුවත්පතේ පළවේ. එම විශේෂාංග ලිපි පෙළ සමඟ එක්වන පාඨක ඔබට දිවයින පුරා ඕනෑම කාගිල්ස් ආයතනයකින් ලබාගත හැකි රුපියල් දහසක තෑගි වවුචරයක් හා පලා මල්ලක් බැගින් වූ අගනා තිළිණ තුනක් ත්‍රී ස්ටාර්ස් ඕගනික් ෆාම් පෞද්ගලික සමාගමේ අනුග්‍රහයෙන් හිමිවේ.